රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 23/98

මගේ අංකය :- IX/TU/23/6
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

1998.09.24

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

**රජය පිළිගත් වෘත්තීය සමිති සම්මේලන පවත්වන කාර්යාලවලට, වෘත්තීය සමිති පවත්වන කාර්යාලවලට සහ එම සම්මේලනවල / සමිතිවල ගරු සභාපතිවරුන් සහ ගරු ලේකම්වරුන් සඳහා රජය විසින් දුරකථන පහසුකම් සැපයීම**

රජය පිළිගත් වෘත්තීය සමිති සම්මේලන කාර්යාලවලටද, සාමාජික සංඛ්‍යාව 5000 ට වැඩි වෘත්තීය සමිති කාර්යාලවලටද, එකී වෘත්තීය සමිති / සම්මේලනවල හා සාමාජික සංඛ්‍යාව 5000 ට වැඩි වෘත්තීය සමිතිවල ගරු සභාපතිවරුන්ගේ සහ ගරු ලේකම්වරුන්ගේ නිවාසවලටද, ඔවුන් තම නිල කාලය දරන තාක් පමණක් සීමාවීමට යටත්ව දුරකථන පහසුකම් සැලසීමට රජය විසින් තීරණය කර ඇත.

02. ඒ අනුව පහත සඳහන් කොන්දේසි යටතේ දුරකථන පහසුකම් සපයනු ලැබේ.

**(1) සවි කිරීමේ ගාස්තු.**

(අ) රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතට ගැනෙන දිප ව්‍යාප්ත සේවාවන්හි හා ඒකාබද්ධ සේවාවන්හි සේවයේ නියුක්ත සාමාජිකයින්ගෙන් සමන්විත වෘත්තීය සමිති සම්මේලන / වෘත්තීය සමිති සම්බන්ධයෙන් වන විට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් ද,

(ආ) අනිකුත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු යටතට ගැනෙන දිප ව්‍යාප්ත හා වෙනත් සේවාවන්වල සේවයේ නියුක්ත සාමාජිකයින්ගෙන් සමන්විත වෘත්තීය සමිති සම්මේලන හා වෘත්තීය සමිති සම්බන්ධයෙන් වනවිට ඒ ඒ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තු විසින්ද දැරිය යුතුය.

(ඇ) එකී තනතුරුවලට සම්බන්ධිත නිලධාරීන් වෙනස් වීමේදී එම නව නිලධාරියාගේ නිවසට දුරකථන සවි කරන්නේ නම් , අදාල වෘත්තීය සමිති සම්මේලනය / වෘත්තීය සමිතිය විසින් සවි කිරීමේ ගාස්තු දැරිය යුතුයි.

02. ලියාපදිංචි ගාස්තු, වාර්ෂික බදු මුදල් හා මාසික බිල්පත් (භාණ්ඩ හා සේවා බද්ධ හා ආරක්ෂක බදු සමග ) අදල වෘත්තීය සමිති / සම්මේලන හා අදාළ නිලධාරීන් විසින් ගෙවිය යුතුය.

03. එකී දුරකථන පහසුකම් සැපයීම 1998.01.01 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතුය.

අ.කලේ/(පී.ඒ.සේනාරත්න)
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු
හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය